වැවිලි අමාත්‍යාංශය
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**

# පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ අග්‍රස්ථ ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලය පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සිත්ගන්නා සුළු පෞරුෂයකින් හෙබි ගතික සහ ප්‍රතිඵල ඉලක්ක කරගත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවා සිටී.

## සහකාර අධ්‍යක්ෂ (රසායනාගාර) තනතුර ශ්‍රේණිය II-MM (1-1)

**රැකියා විස්තරය**

මණ්ඩලයේ අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා) විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට පහසුකම් සැපයීම සහ එයට පරිපූරක වශයෙන් විශේෂයෙන් පවරනු ලබන පරිදි පවතින සහ නව කර්මාන්ත අවශ්‍යතා සඳහා පරීක්ෂණ ක්‍රමවේදයන් හඳුනාගැනීම, සංවර්ධනය, විකරණය, තහවුරු කිරීම සහ වලංගු කිරීමට අදාළ සියලු තත්ත්ව ක්‍රියාපටිපාටීන් අධීක්ෂණය සහ පරීක්ෂා කිරීම. රසායනාගාර නව ප්‍රමිතීන්/මාර්ගෝපදේශ සැකසීම සහ ප්‍රතිතන ක්‍රියා පටිපාටි සහ යහපත් රසායනාගාර පරිචයට (GLP) සම්බන්ධ අනෙකුත් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම. පාරිභෝගික පැමිණිලි සඳහා නම් කරන ලද නිලධාරියා සහ ගුණාත්මකභාවය සම්බන්ධ ගැටළු සඳහා උපදේශක.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව හෝ ක්ෂුද්‍ර ජීව විද්‍යාව එක් විෂයක් ලෙස හදාරමින් ලබාගත් විද්‍යා උපාධිය

සහ

සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ හෝ පිළිගත්/ ISO 17025 ප්‍රතීතනය ලත් පුද්ගලික අංශයේ සංවිධානයක අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්ද (විශ්ලේෂණාත්මක පරීක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ)

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් සහ පළපුරුද්ද ලබා තිබීම.

## සහකාර අධ්‍යක්ෂ (තත්ව) තනතුර ශ්‍රේණිය II-MM (1-1)

**රැකියා විස්තරය**

මණ්ඩලයේ අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා) විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට පහසුකම් සැපයීම සහ එයට පරිපූරක වශයෙන් විශේෂයෙන් පවරනු ලබන පරිදි තේ සාම්පල සම්බන්ධව සිදු කෙරෙන සියලුම තත්ත්ව ක්‍රියාපටිපාටීන් සහ විශ්ලේෂණ කටයුතු අධීක්ෂණය කිරීම. රසායනාගාර තත්ත්ව ක්‍රියාපටිපාටීන් සහ යහපත් රසායනාගාර පරිචයට (GLP) අදාළ වෙනත් කටයුතු සහ රසායනාගාර ප්‍රතිතන ක්‍රියා පටිපාටීන්ට අදාළ කටයුතු නඩත්තුව.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව හෝ ක්ෂුද්‍ර ජීව විද්‍යාව එක් විෂයක් ලෙස හදාරමින් ලබාගත් විද්‍යා උපාධිය

සහ

සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ හෝ පිළිගත්/ ISO 17025 ප්‍රතීතනයලත් පුද්ගලික අංශයේ සංවිධානයක අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්ද (තත්ව කළමනාකරණ ක්ෂේත්‍රය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ).

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් සහ පළපුරුද්ද ලබා තිබීම.

## සහකාර අධ්‍යක්ෂ (රසායන) තනතුර ශ්‍රේණිය II-MM (1-1)

**රැකියා විස්තරය**

මණ්ඩලයේ අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා) විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට පහසුකම් සැපයීම සහ එයට පරිපූරක වශයෙන් විශේෂයෙන් පවරනු ලබන පරිදි රසායනික පරීක්ෂණ සඳහා ස්ථාපිත ජාතික, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නියාමන නියෝගවලට සම්බන්ධ කටයුතු සහ රසායනික විශ්ලේෂණ ඒකකයේ තේ සාම්පල පිළිබඳ විශ්ලේෂණ කටයුතු අධීක්ෂණය කිරීම. රසායනාගාර තත්ව ක්‍රියාපටිපාටීන් සහ යහපත් රසායනාගාර පරිචයට (GLP) අදාළ වෙනත් කටයුතු සහ රසායනාගාර ප්‍රතිතන ක්‍රියා පටිපාටීන්ට අදාළ කටයුතු නඩත්තුව.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව එක් විෂයක් ලෙස හදාරමින් ලබාගත් විද්‍යා උපාධිය

සහ

සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ හෝ පිළිගත්/ ISO 17025 ප්‍රතීතනය ලත් පුද්ගලික අංශයේ සංවිධානයක අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්ද (රසායනික පරීක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ).

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් සහ පළපුරුද්ද ලබා තිබීම.

## සහකාර අධ්‍යක්ෂ (පලිබෝධනාශක) තනතුර ශ්‍රේණිය II-MM (1-1)

**රැකියා විස්තරය**

මණ්ඩලයේ අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා) විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට පහසුකම් සැපයීම සහ එයට පරිපූරක වශයෙන් විශේෂයෙන් පවරනු ලබන පරිදි පලිබෝධනාශක පරීක්ෂණ සඳහා ස්ථාපිත ජාතික, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නියාමන නියෝගවලට සම්බන්ධ කටයුතු සහ පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකයේ තේ සාම්පල පිළිබඳ විශ්ලේෂණ කටයුතු අධීක්ෂණය කිරීම. රසායනාගාර තත්ව ක්‍රියාපටිපාටීන් සහ යහපත් රසායනාගාර පරිචයට (GLP) අදාළ වෙනත් කටයුතු සහ රසායනාගාර ප්‍රතිතන ක්‍රියා පටිපාටීන්ට අදාළ කටයුතු නඩත්තුව.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව එක් විෂයක් ලෙස හදාරමින් ලබාගත් විද්‍යා උපාධිය

සහ

සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ හෝ පිළිගත්/ ISO 17025 ප්‍රතීතනය ලත් පුද්ගලික අංශයේ සංවිධානයක අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්ද (පළිබෝධනාශක අවශේෂ පරීක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ).

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් සහ පළපුරුද්ද ලබා තිබීම

## සහකාර අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර ජීව විද්‍යා) තනතුර ශ්‍රේණිය II-MM (1-1)

**රැකියා විස්තරය**

මණ්ඩලයේ අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා) විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට පහසුකම් සැපයීම සහ එයට පරිපූරක වශයෙන් විශේෂයෙන් පවරනු ලබන පරිදි සහ ක්ෂුද්‍රජීව විද්‍යා පරීක්ෂණ සඳහා ස්ථාපිත ජාතික, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නියාමන නියෝගවලට සම්බන්ධ කටයුතු සහ සහ ක්ෂුද්‍රජීව විද්‍යා විශ්ලේෂණ ඒකකයේ තේ සාම්පල පිළිබඳ විශ්ලේෂණ කටයුතු අධීක්ෂණය කිරීම. රසායනාගාර තත්ව ක්‍රියාපටිපාටීන් සහ යහපත් රසායනාගාර පරිචයට (GLP) අදාළ වෙනත් කටයුතු සහ රසායනාගාර ප්‍රතිතන ක්‍රියා පටිපාටීන්ට අදාළ කටයුතු නඩත්තුව.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාව එක් විෂයක් ලෙස හදාරමින් ලබාගත් විද්‍යා උපාධිය

සහ

සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ හෝ පිළිගත්/ ISO 17025 ප්‍රතීතනය ලත් පුද්ගලික අංශයේ සංවිධානයක අවම වශයෙන් අවුරුදු තුනක (03) පළපුරුද්ද (ක්ෂුද්‍ර ජීව පරීක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ).

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් සහ පළපුරුද්ද ලබා තිබීම

**වයස:** අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි අයවළුන් විය යුතුය අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:** **MM 1-1-2016: රු. 53,175 - 10 x රු. 1,375 - 15 x රු. 1,910 - රු.95,575** අදාළ මූලික වැටුප් පියවර **රු.53,175/-** (මසකට) වේ. ඊට අමතරව මසකට **රු.7800/-** ක ජීවන වියදම් දීමනාව සහ චක්‍රලේඛය අනුව වෘත්තීය දීමනාව ගෙවනු ලැබේ.

**සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා තෝරාගැනීම (රාසායනාගාර/තත්ව/රසායනික/ක්ෂුද්‍ර ජීව විද්‍යා/පළිබෝධනාශක) :**
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

### ප්‍රතිලාභ

- මණ්ඩලයේ බලපවත්නා රීතිවලට අනුකූලව වෛද්‍ය ප්‍රතිලාභ
- අර්ථ සාධක අරමුදල: තෝරාගත් අපේක්ෂකයන්ට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කිරීමට සිදු වේ. මණ්ඩලය විසින් 15% ක දායකත්වයක් ලබා දෙනු ලැබේ.
- මණ්ඩලය විසින් වැටුපෙන් 3% ක දායකත්වයක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ලබා දෙනු ලැබේ.

### පොදු කොන්දේසි

- සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- සෑම අයදුම්කරුවෙකුම තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු ය.
- සෑම අයදුම්කරුවෙකුම විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතු ය.
- තෝරාගත් බාහිර අයදුම්කරුවන් වැඩ භාරගත් දින සිට වසර තුනක (03) කාලයක් සඳහා පරිවාස කාලය මත පත් කරනු ලැබේ. දැනටමත් ස්ථිර කර ඇති අභ්‍යන්තර අපේක්ෂකයින් වසරක අත්හදා බැලීමේ කාල සීමාවකට යටත් වේ.
- බාහිරව බඳවා ගන්නා පුද්ගලයින් අදාළ වැටුප් පරිමාණයේ මූලික වැටුප් පියවරේ ද අභ්‍යන්තරව පත් කරන ලද පුද්ගලයන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අදාළ වැටුප් පරිමාණයට ද ඇතුළත් කරනු ලැබේ.

### අයදුම්පත්‍ර

මෙම කාර්යාලයේ නිලධාරියාගෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මත හෝ අපගේ **http://www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් බාගත කරගත් ආකෘති පත්‍ර අනුව සැකසූ අයදුම්පත් **2021 නොවැම්බර් 23** දිනට පෙර, උප්පැන්න සහතිකයේ පිටපතක්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කරන සහතිකවල පිටපත් සමඟ ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කළ තනතුර දක්වමින් ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතු ය.

දැනට දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා එවිය යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැක.


අධ්‍යක්ෂ ජනරාල්
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**
574, ගාලු පාර,
කොළඹ 03.